**<u>උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම- 2024</u>**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01. | පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. | 01 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව උතුරු මැද පළාත |
| සටහන -: අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට තනතුරට බඳවා ගැනීමට අදාළ සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. | | | | |

**<u>01. බඳවා ගැනීමේ සුදුසුකම්.</u>**

පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන I ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු ඉහත තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

සපුරාලිය යුතු සුදුසුකම් :-

I. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
II. අයදුම්පත් කැඳවන අවසන් දිනට ආසන්න වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් පැවතීම.
III. අයදුම්පත් කැඳවන  අවසන් දිනට ආසන්න වසර 05ක කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමින් හෝ ඉන් ඔබ්බට ලඟා කරගෙන තිබීම හා එම වර්ෂවලට අදාළව වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.
IV. ශ්‍රී ලාංකික පුරවැසියෙක් වීම.
V. විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.

02. වෙනත් සුදුසුකම් :-

I. අයදුම්කරුගේ නායකත්වයෙන් යුතුව ලබාගත් ජාතික ජයග්‍රහණ තිබීම.
II. ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ පත්‍රිකා/ කෘතින් ප්‍රසිද්ධ කර තිබීම.
III. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් විෂයයන් පිළිබඳව දේශිය හෝ විදේශ පුහුණු ආයතන මඟින් ලබා ඇති පුහුණු

අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට තනතුරට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:-

I. මෙම තනතුරට හිමි වැටුප රා.ප.ච. 03/2016 හි SL-1-2016 - රු.47615 - 10X1335 - 08X1630 - 17X2170 - රු.110895ක වැටුප් පරිමාණයෙහි 20 වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.

04. වයස් සීමාව :-

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් වෙතින් පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

මුලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එහිදී ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය හා ආයුර්වේද වෛද්‍ය සේවයට ඉටු කර ඇති සුවිශේෂීය දායකත්වයද, කළමනාකරණ හැකියාවද සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලැබේ. ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු තනතුර සඳහා පත් කරනු ලැබේ.

**<u>උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා පත්කිරීමට අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය- 2024</u>**

| නිර්ණායක | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය | (අ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන I ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 06 බැගින් - (උපරිම ලකුණු 60)<br>(වසරකට අඩු මාස 06ක් හෝ ඊට වැඩි පළපුරුද්දක් සඳහා ලකුණු 03 බැගින්) | 60 |
| 02. රෝහල් කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගෙන ඇති සුදුසුකම් | (අ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයට - (ලකුණු 05)<br><br>(ආ) පශ්චාත් උපාධි සහතිකයට - (ලකුණු 10)<br><br>(උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | 10 |
| 03. පළපුරුද්ද | (අ) රෝහල් හා ආයතන පරිපාලනය පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම<br><br>(රෝහල් හා ආයතන පරිපාලනය පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර ඉන් පසු සේවය කළ එක් වසරක් සඳහා ලකුණු 01 බැගින් ) (ලකුණු 05) | 05 |

| | | |
|---|---|---|
| 04. ආයුර්වේද විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණය පිළිබඳව ලබාගත් අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා අතිරේක වෘත්තීය සුදුසුකම් | (අ) පශ්චාත් උපාධි සහතිකය සඳහා - (ලකුණු 15)<br><br>(ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය සඳහා - (ලකුණු 10)<br><br>(ඇ) ඩිප්ලෝමා සහතිකයක් සඳහා - (ලකුණු 05)<br><br>**මීට අමතරව ලබා ඇති පහත සුදුසුකම් සඳහා**<br><br>(ඇ) මාස 01 සිට 03 දක්වා පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 01)<br><br>(ඉ) මාස 03ට (වැඩි) සිට 06 දක්වා පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 02)<br><br>(උ) මාස 06 (වැඩි) සිට අවුරුදු 01 දක්වා පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 03)<br><br>(ඌ) අවුරුදු 01ට වැඩි පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 04)<br><br>• එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව ලබා ගත් උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>• රජයේ පිළිගත් ආයතනයකින් අදාළ සහතික පත්‍ර ලබා ගෙන ඉදිරිපත් කළ යුතුවේ. | 15 |
| 05. වෙනත් සුදුසුකම් | (අ) සේවයට බඳවා ගැනීමේ භාෂාවට අමතරව ලබා ඇති වෙනත් භාෂා ප්‍රවීණතා පිළිබඳ දැනුම සඳහා (රජයේ පිළිගත් ආයතනයකින් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට සමාන පාඨමාලාවක් හදාරා තිබීම හා එය සහතිකයක් මඟින් සනාථ කර තිබිය යුතුවේ) - (ලකුණු 01)<br><br>(ආ) ප්‍රශංසා හා ජයග්‍රහණ සඳහා (ලබාගෙන ඇති ප්‍රශංසා හා ජයග්‍රහණ සම්බන්ධව ලිඛිතව සනාථ කර තිබිය යුතුවේ) - (ලකුණු 01)<br><br>(ඇ) ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දක්වා ඇති විශේෂ දායකත්වය සඳහා - (ලකුණු 03) | 05 |
| 06. කුසලතාවය | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය සඳහා - (ලකුණු 05) | 05 |
| මුළු ලකුණු | | 100 |

06. අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙළ කර ගත් ජීව දත්ත තොරතුරු ඇතුළත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මඟින්, අයදුම් කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමඟ 2024.01.19 වන දින හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම හෝ මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සළසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ. මේ පිළිබඳ විස්තර කාර්යාල වේලාව තුළ දුරකථන අංක 025-2222773 ඇමතීමෙන් ලබා ගත හැකි වේ.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2023.12.22

**උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් නියෝජ්‍ය / සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම -2024**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින පළාත් නියෝජ්‍ය / සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01. | පළාත් නියෝජ්‍ය/ සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුර | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම. | 01 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව උතුරු මැද පළාත. |
| සටහන -: අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට තනතුරට බඳවා ගැනීමට අදාළ සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය. | | | | |

**01. බඳවා ගැනීමේ සුදුසුකම්.**

පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන II ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු ඉහත තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

සපුරාලිය යුතු සුදුසුකම් :-

I. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
II. අයදුම්පත් කැඳවන අවසන් දිනට ආසන්න වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් පැවතීම.
III. අයදුම්පත් කැඳවන අවසන් දිනට ආසන්න වසර 05ක කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමින් හෝ ඉන් ඔබ්බට ලඟා කරගෙන තිබීම හා එම වර්ෂවලට අදාළව වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.
IV. ශ්‍රී ලාංකික පුරවැසියෙක් වීම.
V. විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම.

02. වෙනත් සුදුසුකම් :-

I. අයදුම්කරුගේ නායකත්වයෙන් යුතුව ලබාගත් ජාතික ජයග්‍රහණ තිබීම.
II. ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ පත්‍රිකා/ කෘතීන් ප්‍රසිද්ධ කර තිබීම.
III. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් විෂයයන් පිළිබඳව දේශීය හෝ විදේශ පුහුණු ආයතන මඟින් ලබා ඇති පුහුණු

අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට තනතුරට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-

I. මෙම තනතුරට හිමි වැටුප රා.ප.ච. 03/2016 හි SL-1–2016 රු.47615 - 10X1355 - 8X1630 - 17X2170 - 110895 වැටුප් පරිමාණයෙහි 12වන වැටුප් පියවර ආරම්භක වැටුප වේ.

04. වයස් සීමාව :-

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් වෙතින් පමණක් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

මුලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එහිදී ජ්‍යෙෂ්ඨතාවය, කුසලතාවය හා ආයුර්වේද වෛද්‍ය සේවයට ඉටු කර ඇති සුවිශේෂිය දායකත්වයද, කළමනාකරණ හැකියාවද සැලකිල්ලට ගෙන ලකුණු ලබා දෙනු ලැබේ. ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරු තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

**<u>උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පළාත් නියෝජ්‍ය / සහකාර ආයුර්වේද කොමසාරිස් තනතුරට පත්කිරීමට අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය 2024</u>**

| නිර්ණායක | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨතාවය | (අ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට ලකුණු 10 බැගින්<br><br>(ආ) ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ සේවා කාලය සඳහා වසරකට අඩු මාස 06ක් හෝ ඊට වැඩි පළපුරුද්දක් සඳහා ලකුණු 05 බැගින් | 60 |
| 02. රෝහල් කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගෙන ඇති සුදුසුකම් | (අ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයට - (ලකුණු 05)<br><br>(ආ) පශ්චාත් උපාධි සහතිකයට - (ලකුණු 10)<br><br>(උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | 10 |
| 03. පළපුරුද්ද | (අ) රෝහල් හා ආයතන පරිපාලනය පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම<br><br>(රෝහල් හා ආයතන පරිපාලනය පිළිබඳව වසර තුනකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර ඉන් පසු සේවය කළ එක් වසරක් සඳහා ලකුණු 01 බැගින් ) (ලකුණු 05) | 05 |

| | | |
|---|---|---|
| 04. ආයුර්වේද විෂය ක්ෂේත්‍රයට අදාළව කළමනාකරණය පිළිබඳව ලබාගත් අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා අතිරේක වෘත්තීය සුදුසුකම් | (අ) පශ්චාත් උපාධි සහතිකය සඳහා - (ලකුණු 15)<br><br>(ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකය සඳහා - (ලකුණු 10)<br><br>(ඇ) ඩිප්ලෝමා සහතිකයක් සඳහා - (ලකුණු 05)<br><br>**මීට අමතරව ලබා ඇති පහත සුදුසුකම් සඳහා**<br><br>(ඈ) මාස 01 සිට 03 දක්වා පුහුණු/පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 01)<br><br>(ඉ) මාස 03 සිට 06 දක්වා පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 02)<br><br>(උ) මාස 06 සිට අවුරුදු 01 දක්වා පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 03)<br><br>(ඌ) අවුරුදු 01ට වැඩි පුහුණු/ පාඨමාලා සහතිකයක් සඳහා - (ලකුණු 04)<br><br>• එක් විෂය ක්ෂේත්‍රයකට අදාළව ලබා ගත් උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>• රජයේ පිළිගත් ආයතනයකින් අදාළ සහතික පත්‍ර ලබා ගෙන ඉදිරිපත් කළ යුතු වේ. | 15 |
| 05. වෙනත් සුදුසුකම් | (අ) සේවයට බඳවා ගැනීමේ භාෂාවට අමතරව ලබා ඇති වෙනත් භාෂා ප්‍රවීණතා පිළිබඳ දැනුම සඳහා (රජයේ පිළිගත් ආයතනයකින් සහතික පත්‍ර පාඨමාලාවක් හෝ ඊට සමාන පාඨමාලාවක් හදාරා තිබීම හා එය සහතිකයක් මඟින් සනාථ කර තිබිය යුතු වේ) - (ලකුණු 01)<br><br>(ආ). ප්‍රශංසා හා ජයග්‍රහණ සඳහා (ලබාගෙන ඇති ප්‍රශංසා හා ජයග්‍රහණ සම්බන්ධව ලිඛිතව සනාථ කර තිබිය යුතු වේ) - (ලකුණු 01)<br><br>(ඇ) ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රගමනයට දක්වා ඇති විශේෂ දායකත්වය සඳහා - (ලකුණු 03) | 05 |
| 06.කුසලතාවය | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් කුසලතාවය සඳහා - (ලකුණු 05) | 05 |
| මුළු ලකුණු | | 100 |

06. අයදුම්කරුවන් විසින් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව පිළියෙළ කර ගත් ජීව දත්ත තොරතුරු ඇතුළත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම් මඟින්, අයදුම් කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමග 2024.01.19 වන දින හෝ එදිනට පෙර ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු මැද පළාත, අනුරාධපුර යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුයි.

07. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම හෝ මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සළසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ. මේ පිළිබඳ විස්තර කාර්යාල වේලාව තුළ දුරකථන අංක 025-2222773 ඇමතීමෙන් ලබා ගත හැකි වේ.

ලේකම්,<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
උතුරු මැද පළාත,<br>
අනුරාධපුර.<br>
2023.12.22